# 1.37 කොහොඹා යක් කංකාරි ශාන්තිකර්මයට අදාළව තොරාගත් ශාස්ත්‍රීය නර්තන අංග කීපයක උඩරට බෙර වාදනයේ දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳ සත්කෝරළය සහ සතර කෝරළය මූලික කරගෙන හැඳින්වීමක්

ඩී. පී. එම්. නිශාන්ත දේවසිංහ
දෘශ්‍ය කලා සැලසුම්කරණ හා ප්‍රාසාංගික කලා ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය වන කොහොඹා යක් කංකාරිය සත් කෝරළය, සතර කෝරළය, උඩුනුවර, යටිනුවර, නුවර කලාවිය, දුම්බර, හේවාහැට, ආදී ප්‍රදේශයන් හි ව්‍යාප්තව පවතී.

කොහොඹා යක් කංකාරියේ අරමුණ ඉෂ්ට කර ගැනීමෙහිලා බෙර වාදනයේ සුවිශේෂතා මෙන්ම විවිධ ශබ්ධ ධ්වනි හා බෙර වාදන ගුරුකුල අතර පවතින වෙනස්කම් ද බෙහෙවින් වැදගත් වේ. ප්‍රාදේශීයව පවතින එකී වෙනස්කම් පිළිබඳ ව සත් කෝරළය හා සතර කෝරළය යන ප්‍රදේශ දෙක මූලික කරගෙන එම ප්‍රදේශ දෙක අතර උඩරට බෙර වාදනයේ දක්නට ලැබෙන නොයෙක් වෙනස්කම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම මෙහි මූලික අරමුණයි.

ආංගික, වාචික, සාත්වික, ආහාර්ය, ආදී සතර අභිනය ප්‍රකාශනයෙන් පූජා පවත්වා දේව ශාන්තිය උදාකර ගැනීමෙහි ලා තත්, ජිත්, තොං, නං, යන සතර බීජාක්ෂර මූලික කරගෙන ගැටබෙරයෙන් නිපදවෙන ශබ්ද ධ්වනිය වැදගත් මෙහෙයක් ඉටුකරනු ලබයි,

කොහොඹා යක් කංකාරියේ බෙර වාදනයේ දී භාවිත වන බෙර පද, කස්තිරම් සහ අඩව් ප්‍රාදේශීය වශයෙන් විවිධ වෙයි. ඒ අනුව කංකාරියේ දී යොදා ගන්නා මගුල් බෙර වාදනය, යක්තුන් පදය, හත්පද පෙළපාළියේ එන කොතල පදය, මඩුපුරයේ එන මල් හත් පදය, ආදී ශාස්ත්‍රීය අංග ඉදිරිපත් කිරීමේ දී බෙර වාදනයේ දක්නට ලැබෙන වෙනස්කම් කිහිපයක් පිළිබඳ සත් කෝරළය සහ සතර කෝරළය මූලික කර ගෙන පෙන්වා දීම මෙහි අරමුණයි.

මෙම විවිධත්වය ඇති වී තිබෙන්නේ වාදනයට අනුව නර්තකයාගේ ශිල්පීය දක්ෂතාව ඉස්මතු කිරීම සහ තිත් මාත්‍රා වලට අනුව කස්තිරම්, අඩව් ආදිය ඉදිරිපත් කිරීමේ දී වාදකයාගේ ශිල්පීය ප්‍රාගුණ්‍යය ඉස්මතු කිරීමට ගන්නා උත්සාහය නිසාය.

උඩරට නර්තන කලාව පිළිබඳ අධ්‍යයනයෙහි යෙදෙන්නන්ට කොහොඹා යක් කංකාරියට අදාල වාදන අංශයෙහි ප්‍රාදේශීයව පවතින සුවිශේෂතා හඳුනා ගැනීමට ද මෙමගින් හැකියාව ලැබෙනු ඇත.